සදකා හෙවත් දන් දීමෙන් ගැත්තකුගේ ධනය අඩු නොවේ. අපරාධයට ලක් වූ ගැත්තාට සිදුවන අපරාධය මත ඔහු ඉවසා සිටීමෙන් අල්ලාහ් ඔහුට ගෞරවය වැඩි කරනු මිස නැත. යාචකත්වයේ දොරටුව ගැත්තෙකු විසින් විවෘත කළ විට අල්ලාහ් දිළිඳුභාවයේ දොරටුව ඔහු වෙත විවෘත කරනු මිස නැත.

අබූ කබෂා අම්ර් ඉබ්නු සඃද් අල් අන්සාරී -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. මෙය මර්ෆූඃ ගණයට අයත් හදීසයකි. කරුණු තුනක් ඇත. මම ඒවා මත දිවුරමි. තවද මම ඔබට ප්රකාශයක් කරමි. එය ඔබලා ආරක්ෂා කරන්න: "සදකා හෙවත් දන් දීමෙන් ගැත්තකුගේ ධනය අඩු නොවේ. අපරාධයට ලක් වූ ගැත්තාට සිදුවන අපරාධය මත ඔහු ඉවසා සිටීමෙන් අල්ලාහ් ඔහුට ගෞරවය වැඩි කරනු මිස නැත. යාචකත්වයේ දොරටුව ගැත්තෙකු විසින් විවෘත කළ විට අල්ලාහ් දිළිඳුභාවයේ දොරටුව ඔහු වෙත විවෘත කරනු මිස නැත. තවද මම නුඹලාට ප්රකාශයක් කරමි. එය නුඹලා ආරක්ෂා කරනු. "සැබැවින්ම මෙලොව පුද්ගලයින් සිවු දෙනෙක් සතුය.: ගැත්තෙකු වනාහි, අල්ලාහ් ඔහුට ධනය හා දැනුම පිරිනමා ඇත. ඒ සම්බන්ධයෙන් ඔහු තම පරමාධිපතිට බිය වෙයි. ඒ තුළින් ඥාතී සම්බන්ධකම් ආරක්ෂා කරයි. සත්යය අල්ලාහ් වෙනුවෙන් දන්වා සිටියි. මෙය තරාතිරමින් ශ්රේෂ්ඨතම දෑ වෙයි. තවත් ගැත්තෙකු වනාහි ඔහුට අල්ලාහ් දැනුම දී තිබුණ ද මුදල් පිරිනමා නැත. එවිට ඔහු සැබෑ චේතනාවෙන් යුතුව, මට ධනය ඇත්නම් මේ පුද්ගලයා කටයුතු කරන අයුරින් මමත් කටයුතු කරමි යැයි පවසයි. ඔහු එම චේතනාවෙහිම පසුවෙයි. ඔවුන් දෙදෙනාගේ ප්රතිඵල එකසමානය. තවත් ගැත්තකු වනාහි ඔහුට අල්ලාහ් ධනය පිරිනමා තිබුණද දැනුම පිරිනමා නැත. කිසිදු දැනුමකින් තොරව ඔහුගේ ධනය සම්බන්ධයෙන් ඔහු පහත් තත්ත්වයට පත් වෙයි. ඒ සම්බන්ධයෙන් තම පරමාධිපතිට බිය නොවෙයි. ඒ තුළින් තම ඥාතීන් සමග සම්බන්ධකම් නොපවත්වයි. සෑබෑ ලෙසින් අල්ලාහ් වෙනුවෙන් දන්වා නොසිටියි. එය ඉතා නපුරුම තරාතිරම වේ. තවත් ගැත්තෙකු වනාහි අල්ලාහ් ඔහුට ධනය හෝ දැනුම හෝ පිරිනමා නැත. නමුත් ඔහු මා සතුව ධනය තිබුණේ නම් මෙම පුද්ගලයා කටයුතු කරන අයුරින් එහි මමද කටයුතු කරමි. ඔහු එම චේතනාවෙන්ම පසුවෙයි. ඔවුන් දෙදෙනාගේ කුසල් බර
එක සමානය.
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් තිර්මිදි එය වාර්තා කර ඇත]

නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා දිවුරා සිටි කරුණු තුනක් ඇත. තවදුරටත් ඔවුන් වෙත ප්රකාශයක් කර තිබුණි. එම කරුණු තුන වනාහි, 1- සදකාවෙන් ගැත්තෙකුගේ ධනය අඩු නොවේ: එනම්: එය ඔහු සදකාව පිරිනැමීම තුළින් අභිවෘද්ධිය ලබා දෙන්නකි. 2- අපරාධයට ලක් වූ ගැත්තාට සිදුවන අපරාධය මත ඔහු ඉවසා සිටීමෙන් අල්ලාහ් ඔහුට ගෞරවය වැඩි කරනු මිස නැත. එහි අවමානය ගෙන දෙන වර්ගයේ යමක් අන්තර්ගතව තිබුණ ද අල්ලාහ් ඔහුව උසස් කොට අපරාධකරු අවමානයට ලක් කරනු ඇත. 3- කිසිදු අවශ්යතාවකින් තොරව පොහොසත් වීමේ අපේක්ෂාවෙන් හා ධනය අධික කර ගැනීමේ අපේක්ෂාවෙන් මිනිසුන්ගෙන් ඉල්ලා සිටීමේ දොරටුව විවෘත කරන්නේ ද ඔහුට වෙනත්

අවශ්යතාවක දොරටුව විවෘත කරමින් හෝ ඔහු සතුව ඇති ආශිර්වාදයක් පැහැර ගනිමින් හෝ අල්ලාහ් ඔහුට දිළිඳුභාවයේ දොරටුව විවෘත කරනු ඇත. පසුව මෙලොව කණ්ඩායම් හතරකට සතුය. යැයි පවසා ඔවුන් ගැන මෙනෙහි කළහ.

https://sunnah.global/hadeeth/si/show/5833